4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් පරිච්ඡේදය මෙයින් ආදේශ කරනු ලැබේ :- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

"IX වන පරිච්ඡේදය

**විධායකය**

රාජ්‍ය සේවය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

54. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තා හ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ ඒ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වුවහොත් හෝ ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම හෝ එසේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාම හෝ නොකළ යුත්තේ ය.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කර ගනු ලැබීමට පෙරාතුව ම රාජ්‍ය සේවයේ රජයේ නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම එම ධුරය දැරීම ඉහත කී පත්වීම බලාත්මක වූ විට, නතර වන අතර රාජ්‍ය නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස තවදුරටත් පත් කරනු ලැබීමට ඒ තැනැත්තා සුදුස්සෙක් නොවන්නේ ය :

එසේ වුවද එවැනි යම් තැනැත්තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වන තෙක් හෝ අවස්ථාවෝචිත පරිදි ඔහු රාජ්‍ය නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව සිටියේ නම් ඒ සේවයෙන් ඔහු විශ්‍රාම ගතයුතු වයසට එළඹීම ඒ තැනැත්තා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරද්දී සිදු වුවහොත් හෝ ඒ තැනැත්තාගේ ඒ සේවය වෙනුවෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු විශ්‍රාම වැටුප්, පාරිතෝෂික දීමනා හෝ වෙනත් දීමනාවකට අදාළ විධිවිධානයක කාර්ය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා රාජ්‍ය නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස ද රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි ධුරයක් දරන්නකු ලෙස ද සලකනු ලැබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (2) වන ඡේදය යටතේ යම් නුසුදුසුවීමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින්, නියමිත දිනයට පෙරාතුව ම ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම